# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය

## බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා / බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව - 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට කැමති අපේක්ෂකයින්ගෙන් 2022.12.01 සිට 2022.12.30. දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලාවේ ස්වරූපය**

උක්ත පාඨමාලා බෞද්ධ මනෝවිද්‍යාව, බෞද්ධ උපදේශනය හා මනෝචිකිත්සාව පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමේ අරමුණෙන් සැලසුම් කරන ලද්දකි. නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ බෞද්ධ උපදේශනය සඳහා ඉහළ පිළිගැනීමක් හිමිව තිබේ. ස්වකීය ජීවිතය කළමනාකරණය කර ගැනීමට මෙන්ම උපකාරක සේවාවක් ලෙස උපදේශන සේවාවේ යෙදී සිටින හා එයට පිවිසීමට කැමති ඕනෑම අයෙකුගේ වෘත්තීය කුසලතා සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම මෙම පාඨමාලා තුළින් ලබාදීමට අපේක්ෂිතය. මනෝඋපදේශකයින්, විද්‍යාර්ථීන්, අධ්‍යාපන, සෞඛ්‍ය, නීති, මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත වෘත්තීයවේදීන්ට හා ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන්ට මෙන්ම බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය පිළිබඳ හරවත් ශාස්ත්‍රීය හැදෑරීමකට කැමති ඕනෑම කෙනෙකුට ගැළපෙන පරිදි සැකසූ සති අන්ත පාඨමලා ලෙස මෙම පාඨමාලා හඳුන්වා දී ඇත.

**ඇතුළත්වීමේ සුදුසුකම්:**

**01 බෞද්ධ උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව:**

- අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම

හෝ

- ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත්වීම

හෝ

- බෞද්ධ ධර්මාචාර්ය විභාගය / දහම් පාසල් අවසාන විභාගය සමත්වීම

හෝ

- උපදේශන සේවාවේ නියුතු රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක වසර 2ක පළපුරුද්දක් සහිත අයෙකු වීම

හෝ

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

02 බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාව

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් කවර හෝ ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම

හෝ

- අ.පො.ස (උසස් පෙළ)විභාගය සමත්වී තිබීම

හෝ

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් පිරිනමන බෞද්ධ උපදේශන ඩිප්ලෝමාව සමත් ව තිබීම

හෝ

- කවර හෝ විශ්වවිද්‍යාලයකින් පිරිනමන බෞද්ධ උපදේශනය /මනෝවිද්‍යා ඩිප්ලෝමාවක් සමත් ව තිබීම

හෝ

- පිළිගත් අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මනෝවිද්‍යාව උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් ව තිබීම

හෝ

- දහම් සරසවිය බුද්ධ ධර්ම ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පරීක්ෂණ සමත්ව තිබීම

හෝ

- බුද්ධධර්ම උසස් ඩිප්ලෝමා පරීක්ෂණයෙන් සමත් වීම

හෝ

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලීය සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්

පාඨමාලා කාලයඃ

බෞද්ධ උපදේශන ඩිප්ලෝමා /උසස් ඩිප්ලෝමා පාඨමාලාවඃ අවුරුදු 01

**මාධ්‍යය - සිංහල**

**දේශන 2023 පෙබරවාරි මස ආරම්භ කරනු ඇත.**

**පාඨමාලා ගාස්තුඃ**

**බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව ඃ** රු. 40,000/-

**බෞද්ධ උපදේශනය උසස් ඩිප්ලෝමා පාඨමාලාවඃ** රු. 45,000/-

**(මෙම ගාස්තු වාරික දෙකකින් / තුනකින් ගෙවිය හැකි ය).**

**අයදුම්පත් ලබා ගත හැකි ආකාරයඃ**

අයදුම්පත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට පිවිස www.bpu.ac.lk බාගත කළ හැකි ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත ඉදිරිපත් කිරීමෙන් හෝ හෝ විශ්වවිද්‍යාලයේ සරප් කවුළුවට රු.500/- ක මුදලක් ගෙවීමෙන් ලබා ගන්නා ලද ලදුපත සමඟ අයදුම්පත භාරදිය යුතුය.

තැපැල් මගින් අයදුම්පත් ලබාගැනීමට අපේක්ෂා කරන්නේ නම් දිවයිනේ ඕනෑ ම ලංකා බැංකු ශාඛාවකින් හෝමාගම ලංකා බැංකු ශාඛාවේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක **711202**, දරණ ගිණුමට බැර වන පරිදි රු. 500/- ක් ගෙවා ලබා ගන්නා ලද ලදුපත සමග නම, ලිපිනය ලියන ලද 9"x4" ප්‍රමාණයේ රු. 110/-ක මුද්දර ඇලවූ කවරයක් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. **චෙක්පත් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.** අයදුම්පත් ලබා ගැනීම සඳහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බෞද්ධ උපදේශනය ඩිප්ලෝමා/ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත්‍ර "යනුවෙන්** සඳහන් කළ යුතු ය.

**සැ.යු. - බැංකුවට මුදල් ගෙවීමේ දී ලදුපතෙහි තැන්පත්කරුගේ නම සඳහන් ස්ථානයේ තම නම ඉදිරියෙන් "BC/Dip" යන සංකේත අංකය සඳහන් කර ඒ යටතේ ගෙවීම කළ යුතුය.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2022.12.30 දිනට හෝ එදිනට පෙර එවිය යුතුය.

සහකාර ලේඛකාධිකාරී
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා බාහිර විභාග මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
214, බෞද්ධාලෝක මාවත,කොළඹ 07.

**අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**
**වැඩිදුර තොරතුරු විමසීම්**

**පාඨමාලා සමායෝජක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිලන්ත පී. දිසානායක** : 0718 560 222
**කාර්යාලය** : 011-2580609 /011-2502944

ලේඛකාධිකාරී (වැ.බ)
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.
214 බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.